www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පකිස්ථානයේ අග විනිසුරු ඉවත් කිරීමේ මුෂාරෆ්ගේ ප්‍රයත්නයට එරෙහිව විරෝධය නැගෙයි

## Protests mount against Musharraf attempt to sack Pakistan's chief justice

**විලානි පීරිස් සහ කීත් ජෝන්ස් විසිනි**
**2007 මාර්තු 19**

පකිස්ථාන ශ්‍රේෂ්ඨාධිකරනයේ ප්‍රධානි, අග විනිසුරු ඉෆ්තිබාර් මොහමඩ් චවුධ්රි තනතුරෙන් පහ කිරීමට එක්සත් ජනපද පිටුබලය ලබන එරට මිලිටරි බලවතා වන ජෙනරාල් පර්වේස් මුෂාරෆ් දරන ප්‍රයත්නයට විරුද්ධත්වය දක්වන නීතිඥයන්, විපාර්ශ්වික දේශපාලන ක්‍රියාකාරීන් හා සාමාන්‍ය පකිස්ථානුවන් ද ආරක්ෂක හමුදාවන් ද අතර හටගත් ප්‍රචන්ඩ ගැටුම්වලින් මෑත දිනවල ඉස්ලාමාබාද් හා එරට සෙසු නගර ඇලලී ගොස් තිබේ.

අග විනිසුරු චවුධ්රි උත්තරීතර අධිකරන මන්ඩලය ඉදිරියේ පෙනී සිටීමට නියමිතව සිටි පසු ගිය සිකුරාදා විරෝධතා දැක්වීම් වලකනු වස් පොලීසිය දේශපාලන නායකයන් ගනනාවක් අත් අඩංගුවට ගෙන රඳවා ගත්තේ ය. ඉන් පසුව, විරෝධතා පිලිබඳ සජීවී විකාශනයන් නවතාලීමේ ප්‍රයත්නයක් ලෙස, පොලීසිය පුද්ගලික ජීඊඕ රූපවාහිනී මධ්‍යස්ථානයට කඩා වැදී එය තරයේ සෝදිසි කොට එහි කාර්ය මන්ඩල සාමාජිකයන් බොහෝ දෙනෙකුට ප්‍රචන්ඩ ලෙස පහර දුන්නේ ය. කෙසේ වෙතත්, විරෝධතා පිලිබඳ සජීවී විකාශනය නතර නොවුනි.

1999 ඔක්තෝබරයේ දී මිලිටරි කුමන්ත්‍රනයක් මගින් බලය ඩැහැ ගත් හා “ත්‍රස්ත විරෝධී යුද්ධයේ” සිය ප්‍රධාන සගයකු ලෙස බුෂ් පාලනාධිකාරය විසින් තොරොම්බල් කරනු ලබන මුෂාරෆ් එදිනම ඉන් පසුව රූපවාහිනියේ පෙනී සිට පොලිස් කඩා පැනීම හෙලා දැකීමට තරම් දේශපාලනික විය. ඉන් පසුව පහල මට්ටමේ පොලිස් නිලධාරින් කිහිප දෙනෙකුගේ සේවය අත් හිටුවා ඇති නමුදු ඇසින් දුටු සාක්ෂ්‍යකරුවන්ට අනුව, පොලිස් කඩා පැනීම මෙහෙයවනු ලැබුවේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරින් විසිනි.

මාර්තු 9 දා “අවචර්යාව හා බලය දුෂ්පරිහරනය කිරීම” ගැන චෝදනා කරමින් අග විනිසුරු චවුධ්රිගේ සේවය අත් හිටවූ මුෂාරෆ්, දූෂන චෝදනා ගැන පරීක්ෂන පවත්වන ලෙස අධිකරන මන්ඩලයට අන කොට අන්තර්-වාර අධිකරන ප්‍රධානියකු නම් කල අතර චවුධ්රි තථ්‍ය ලෙස නිවාස අඩස්සියේ තැබුවේ ය.

දූෂන චෝදනා විනිවිද පෙනෙන වංචනික උපාමාරුවකි. ඔවුන්ගේ දූෂන භාවිතාවන් පිලිබඳ සාක්ෂ්‍ය එකතු කර ගෙන ඉන් පසුව ඒවා යට ගැසීම මගින් බෙනාසීර් භූතෝගේ පකිස්ථාන මහජන පක්ෂය (පීපීපී) සහ නවාෂ් ෂරීෆ්ගේ පකිස්ථාන මුස්ලිම් ලීගය (ෂරීෆ්) වෙතින් මුෂාරෆ් විසින් බිඳවා ගනු ලැබූ දේශපාලනඥයන්ගෙන් පකිස්ථාන පාර්ලිමේන්තුවේ වත්මන් ඇමති මන්ඩලය හා ආන්ඩු පාර්ශ්වය පිරී ඇත යන්න ප්‍රසිද්ධ කරුනකි.

මුෂාරෆ් චවුධ්රිව ඉලක්ක කර ගෙන ඇත්නම්, ඒ පකිස්ථානයේ සන්නද්ධ සේවා ප්‍රධානීන්ගේ නායකයා ලෙස ද ක්‍රියා කරමින් ද්විත්ව තනතුරු දරන ජනාධිපති, දේශපාලනිකව විශ්වාසය තැබිය නොහැකි පුද්ගලයකු ලෙස ඔහුව සලකන බැවිනි. රටේ ව්‍යවස්ථාව විවෘතව උල්ලංඝනය කරමින්, තවත් පස් අවුරුදු කාල සීමාවක් සඳහා තමාව ජනාධිපති ලෙස යලි තෝරා ගැනීම සංවිධානය කිරීමටත් සන්නද්ධ සේවා ප්‍රධානීන්ගේ නායකයා ලෙස දින නියමයක් නැතිව දිගටම රැඳී සිටීමටත් ඔහු සැලසුම් කරන බැවින් තමන්ට කීකරු ශ්‍රේෂ්ඨාධිකරනයක් මුෂාරෆ්ට අවශ්‍ය කරන අවස්ථාවකි මෙය.

පකිස්ථාන ව්‍යවස්ථාව යටතේ, රටේ ජනාධිපති තෝරන මැතිවරන මන්ඩලය සමන්විත වනුයේ ප්‍රාදේශීය හා ජාතික ව්‍යවස්ථාදායක සභාවලිනි. ඡන්දදායකයන් පකිස්ථානයේ ප්‍රාදේශීය හා ජාතික ව්‍යවස්ථාදායක සභාවන් තෝරා පත් කර ගැනීමෙන් පසුව ඉක්මනින් ම ජනාධිපති තෝරා පත් කර ගැනෙන මන්ඩලය කැඳවනු ලැබේ.

කෙසේ වෙතත්, මුෂාරෆ්ගේ අන්තේවාසිකයන් ප්‍රසිද්ධ කර ඇති ආකාරයට, 2002 දී තෝරා පත් කර ගැනුනු දැනට පවත්නා ප්‍රාදේශීය හා ජාතික ව්‍යවස්ථාදායක සභා මගින් මේ වසර අග දී තමාව ජනාධිපති ලෙස “යලි තෝරා පත් කර” ගැනීමට ජෙනරාල්-ජනාධිපති සූදානම් වේ. මෙම ව්‍යවස්ථාදායක සභාවල ජනවරම වසර පහක් පැරනි වනවා පමනක් නොව, ඒවා පිහිටුවීමට තුඩු දුන් මැතිවරන ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කිරීමක් ද විය.

බෙනාසීර් භුටෝ හා නවාෂ් ෂරීෆ් යන දෙදෙනාගෙන් එක් අයකුට වත් මැතිවරනයට සහභාගි වීමට ඉඩ නොදුන් අතර මිලිටරි තන්ත්‍රය පීපීපීයේ හා සෙසු විපාර්ශ්වික පක්ෂවල මැතිවරන ව්‍යාපාරවලට සෑම ආකාරයකින් ම සීමාවන් පැනවී ය. ඒ අතරතුර, ආන්ඩුවට ගැති පක්ෂවල සහ සම්ප්‍රදායිකව මිලිටරියේ අනුග්‍රහය ලැබුනු හා නිරන්තරයෙන් මුෂාරෆ්ගේ ආධාරයට ඉදිරිපත් වුනු ඉස්ලාම් මූලධර්මවාදී පක්ෂවල සන්ධානයක් වන එම්එම්ඒ සංවිධානයේ සහායට රාජ්‍ය යන්ත්‍රනය බලමුලු ගන්වන ලද අතර ඔවුන්ට නිදහසේ මැතිවරන ව්‍යාපාරයේ යෙදීමට අවසර දුනි.

සිය යලි තේරී පත් වීම සහතික කර ගැනීමේ හා පකිස්ථානයේ සන්නද්ධ හමුදාවල ප්‍රධානියා ලෙස දිගටම රැඳී සිටීමේ සිය උත්සාසය අධිකරනයේ දී අභියෝගයට ලක් වනු ඇති බව මුෂාරෆ් හොඳින් දනී. සිය ආඥාදායකත්වය දිගටම පවත්වා ගෙන යාමේ හා පකිස්ථාන ජනතාවගේ මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් උදුරා ගැනීමේ මෙම මැතම විවෘත ප්‍රයත්නය මගින් අවුලුවනු ඇති මහජන විරෝධයේ නැගීමට මුහුන දීමේ යම් ඉඩ ප්‍රස්ථාවක් ලබා ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරනයේ රබර් මුද්‍රා අනුමැතිය ඔහුට අවශ්‍ය වනු ඇත.

පකිස්ථානයේ විපාර්ශ්වික පක්ෂ, මානව හිමිකම් සංවිධාන සහ රටේ සියලුම නීතිඥ සංවිධාන පාහේ අග විනිසුරු චවුධ්රිට එරෙහිව මුෂාරෆ් ගත් පියවර ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවක් ලෙස හෙලා දැක තිබේ. ඔවුන් කියා සිටින්නේ, අග විනිසුරුවරයකුට එරෙහිව අවචර්යාව පිලිබඳ චෝදනාව යටතේ නඩුවක් ගොනු කිරීමට ජනාධිපතිට හැකි වුවත් ඔහු රට තුල නිදහසේ ගමන් කිරීම නතර කරනු තබා ඔහු සිය අධිකරනමය ක්‍රියාකාරකම්වල යෙදීමෙන් විනිසුරුවරයකු වලකාලීම ජනාධිපතිට කල නොහැකි බව යි.

මුෂාරෆ්ට ගැති පකිස්ථාන මුස්ලිම් ලීගයේ (ක්වාඩ්-ඉ-අසාම්) කොටස් පවා ජනාධිපති චවුධ්රි සිද්ධිය පිලිබඳව කටයුතු කරන ආකාරයෙන් ඈත් වී ගැනීමට උත්සාහ කර තිබේ. අග විනිසුරුගේ සේවය අත් හිටුවීම" හමුදාව හා අධිකරනය අතර අභ්‍යන්තර කාරනාවක්" යැයි පීඑම්එල්-ක්‍යු ජනාධිපති චවුධ්රි ෂුජාට් හුසේන් පසු ගිය සතියේ දී නිව් යෝර්ක් නුවරට කල සංචාරයක දී පැවසී ය.

මුෂාරෆ් තන්ත්‍රය බහු විධ අර්බුදයන්ගෙන් ඇලලී ගොස් තිබේ. බුෂ් පාලනාධිකාරය, තලිබාන් ව්‍යාපාරය තලා දැමීමෙහි ලා ඉස්ලාමාබාදය මීට වඩා ක්‍රියාත්මක විය යුතු යැයි ඉල්ලා සිටින හා සිය බටහිර අසල්වැසියා වන ඉරානයට එරෙහි කිසියම් එක්සත් ජනපද මිලිටරි ක්‍රියාවක දී පකිස්ථානය තමන්ගේ පැත්තේ සිටිනු ඇතැයි බලාපොරොත්තු වන අතර ම, එක්සත් ජනපද ආක්‍රමනය සමග මුෂාරෆ් සහයෝගී වීමට එරෙහි මහජන විරුද්ධත්වය වැඩෙමින් පවතී. ගැලප් පකිස්ථාන් නම් ආයතනය විසින් මෑත දී සිදු කරන ලද මත විමසුමක ප්‍රතිඵලවලට අනුව, පකිස්ථානුවන්ගෙන් සියයට 83ක් කියා සිටින්නේ, ඇමරිකාව හා තලිබාන් ව්‍යාපාරය අතර ගැටුමේ දී සිය සහානුමතිය ලැබෙන්නේ තලිබාන්වරුන්ට බව යි. සියයට 75ක් දෙනා එක්සත් ජනපදය පකිස්ථානයේ ගුවන් හමුදා කඳවුරු භාවිතා කරනවාට විරුද්ධ ය.

සම්පත්වලින් පොහොසත් බලුකිස්ථාන් පලාත පසු ගිය වසර දෙකක කාලය මුලුල්ලේ ජාතිකවාදී සන්නද්ධ නැගිටීමකින් ඇලලී ගොස් තිබේ. ඇෆ්ඝනිස්ථානයට යාබදව පවතින හා සම්ප්‍රදායිකව ස්වතන්ත්‍ර තත්වයක් භුක්ති විඳ ඇති ගෝත්‍රික ප්‍රදේශවලට ආන්ඩුවේ ආඥාව පතුරුවාලීමේ උත්සාහයක දී සිය භටයන් 800ක් පමන අහිමි වීමෙන් පසුව, ගෝත්‍රික කන්ඩායම් සමග ලැජ්ජා සහගත ගිවිසුමකට එකඟ වීමට හමුදාවට බල කෙරුනි.

අවසන් එහෙත් අඩු වැදගත්කමක් නොදරන කාරනය නම්, මුෂාරෆ් තන්ත්‍රයේ නව ලිබරල්වාදී ආර්ථික පිලිවෙත්වල ප්‍රතිඵලයක් වන වැඩෙන ආර්ථික ආනාරක්ෂක භාවය හා දරිද්‍රතාව සම්බන්ධයෙන් වර්ධනය වන මහජන වෛරය යි. පසු ගිය පස් වසර තුල අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල ගනන් සියයට 50ක සාමාන්‍යයකින් වැඩි වී ඇත.

මුෂාරෆ් තවමත් ආරක්ෂා වී ඇත්නම්, ඒ ඔහුට වොෂිංටනයෙන් ලැබෙන බලගතු සහයෝගය නිසා සහ තමන්ගේ ම වරප්‍රසාද ආරක්ෂා කරන කොටු පවුරක් වන පකිස්ථාන රාජ්‍යයේ බලයට හා මිලිටරියේ ඒකාබද්ධතාවට කිසියම් මහජන ව්‍යාපාරයක් තර්ජනය කරනු ඇති බවට ධනේශ්වර විරුද්ධ පක්ෂ දක්වන භීතිය හේතු කොට ගෙන ය.

පකිස්ථානයේ උසාවි මිලිටරිය හා මිලිටරි පාලකයන් ඉදිරියේ සම්ප්‍රදායිකව යටත් වී ඇත.

ඔහුගේ 1999 බල කොල්ලය නීත්‍යානුකූල කල ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුව සහ ඔහු ජනාධිපති ලෙස බලයේ පිහිටු වූ 2002 ජනමත විචාරනය අනුමත කල තවත් නඩු තීන්දුවක් ද ඇතුලුව මුෂාරෆ් ආඥාදායකත්වයට නීතිමය කඩතුරාවක් සම්පාදනය කල නඩු තීන්දු ගනනාවකට චවුධ්රි ම දායක වී ඇත.

එහෙත් 2005 දී පකිස්ථාන අධිකරන පද්ධතියේ ප්‍රධානියා බවට පත් වීමෙන් පසුව ඔහු ආන්ඩුවේ න්‍යාය පත්‍රය සමග ගැටෙන නඩු තීන්දු ගනනාවක් දී ඇත. ජෙනරාල්ගේ" යලි තේරී පත්වීමට" රබර් මුද්‍රාව තැබීම ද අවශ්‍යතාව පැන නැගුන හොත් සිය පාලනයට එරෙහි යම් අභියෝගයක් මෘග ලෙස පාගා දැමීමක් ද සම්බන්ධයෙන් චවුධ්රි කෙරෙහි විශ්වාසය තැබිය හැකි ද යන්න පිලිබඳ සැකයක් එමගින් මුෂාරෆ්ගේ මනස තුල පැහැදිලිව පැන නැගුනි.

බීබීසී ප්‍රවෘත්ති සේවයට අනුව, තම මතය වන්නේ “ජනාධිපති ලෙස තමන්ගේ ධුර කාලයෙන් ඔබ්බට හමුදා ප්‍රධානියා ලෙස දිගට ම රැඳී සිටීම ජෙනරාල් මුෂාරෆ්ට නොහැකි” බව යැයි චවුධ්රි පෙබරවාරියේ දී ආධුනික මිලිටරි නිලධාරින් පිරිසක් ඉදිරියේ කියා සිටියේ ය.

ඔහු තනතුරෙන් ඉවත් කිරීමට යන්තම් දිනකට පෙර, අග විනිසුරු විමසමින් සිටියේ ඉස්ලාම්වාදී ත්‍රස්ත සංවිධාන සමග සම්බන්ධකම් ඇතැයි බලධාරින් සැක කරන පුද්ගලයන් “බලාත්කාරයෙන් අතුරුදහන් කිරීම” පිලිබඳ නඩුවකි. අතුරුදහන් වූ පුද්ගලයන් සිටින තැනක් සොයා ගැනීමට ආන්ඩුව අපොහොසත් වීම ගැන චවුධ්රි එහි දී සිය බලගතු අසතුට ප්‍රකාශ කලේ ය. සිය ගනන් පුද්ගලයන් නාඳුනන ආරක්ෂක බලකායන් විසින් නීති විරෝධී ලෙස පැහැර ගෙන යනු ලැබ නඩු විමසීමකින් තොරව රඳවා ගෙන වධ බන්ධනයන්ට පත් කෙරෙතැයි චෝදනා කෙරේ.

චවුධ්රි, රටේ විශාලතම කාර්මික ව්‍යවසාය වන පකිස්ථාන් ස්ටීල් මිල්ස් ආයතනය බොහෝ නිරීක්ෂකයන් කුනු කොල්ලයට විකිනීමක් ලෙස සැලකූ මිලකට රුසියානු, සවුදි හා පකිස්ථානු ආයෝජකයන්ට විකිනීමට ආන්ඩුව එලඹ තිබූ ගිවිසුමක් අහෝසි කරන ලෙස 2006 අගෝස්තු 8 දා දුන් නඩු තීන්දුවේ ප්‍රධාන විනිසුරු ද විය. සමස්ත ගනුදෙනුව ම “නීතිය උල්ලංඝනය කිරීමක්” හා “මූලුමනින් ම අක්‍රමිකතාවන්ගෙන්” යුක්ත එකක් බව සිය තීන්දුවේ දී අග විනිසුරු කියා සිටියේ, ආන්ඩුවේ සාමාජිකයන් හා ඔවුන්ගේ ව්‍යාපාරික මිතුරන් මෙම පුද්ගලීකරන ගනුදෙනුවෙන් නොසැහෙන්න වාසි ලබා ගන්ට ඇතැයි මහජනතාව තුල සැක සංකා මතු කරමිනි.

මේ වසරේ මුල් කාලයේ දී දුන් තවත් නඩු තීන්දුවක දී, චවුධ්රි මිලිටරිය හා ආන්ඩුව තව දුරටත් කුපිත කලේ, දැවැන්ත නව වරායක් ගොඩ නගන භූමියක් වන ග්වාඩර්හි ඉඩම් අක්කර 241,600ක් ඇමතිවරුන්ට, දේශපාලනඥයන්ට හා වෙනත් නිලධාරින්ට නීති විරෝධී ලෙස වෙන් කිරීම පිලිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස බලූකිස්ථාන ආන්ඩුවට නියෝග කිරීම මගිනි.

අග විනිසුරු තනතුරෙන් පහ කිරීමේ මුෂාරෆ්ගේ ප්‍රයත්නය පැහැදිලිව ම වැරදී ඇත. එක්සත් ජනපද ආරක්ෂක ඒජන්සි සමග සමීප සබඳතා පවතින පුද්ගලික ඔත්තු සේවාවක් වන ස්ට්‍රැට්ෆෝර් ආයතනයට අනුව, “මෙම අර්බුදයේ එකම ගොඳුර මුෂාරෆ් විය නොහැකි ය. වියවුල යලි යථා තත්වයට පත් වන විට මිලිටරියේ බල ග්‍රහනය ද දුර්වල වී තිබිය හැකි ය.”

කෙසේ වෙතත්. පකිස්ථානයේ ආඥාදායක තන්ත්‍රයට මුක්කු ගැසීමට බුෂ් පාලනාධිකාරය තවමත් තීන්දු කර ඇත.

පසු ගිය සිකුරාදා, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රකාශක සීන් මැක්කොර්මැක් “නිදහස් විරෝධතාවන්ට ඉඩ දෙන” ලෙස පකිස්ථාන පොලීසියට චාරිත්‍රානුකූල ආයාචනයක් කිරීමෙන් පසුව, පකිස්ථානයේ මිලිටරි බලවතා ප්‍රශංසාවට ලක් කලේ ය. “ජනාධිපති මුෂාරෆ් හොඳ මිතුරෙක් හා ත්‍රස්ත විරෝධී යුද්ධයේ සගයෙකි. දේශපාලනික, ආර්ථික හා සමාජ ප්‍රතිසංස්කරන සම්බන්ධයෙන් ඔහුට පකිස්ථානය සඳහා දැක්මක් තිබෙන අතර ඔහු එම මාවත ඔස්සේ ගමන් කරයි.

“තවත් දේ කිරිමට තිබේ ද? ඔව්, සත්තකින් ම.

“නමුත් ජනාධිපති මුෂාරෆ් පකිස්ථානයේ හා පකිස්ථාන ජනතාවගේ හොඳම අවශ්‍යතා වෙනුවෙන් ක්‍රියා කරයි.”

© www.wsws.org